**බණ්ඩාරවෙල මහා නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
-----------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
-----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
-------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 05 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 06 දින මහා නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත යවා ඇත.

1.2 **මතය**
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
--------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.10,454,085 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පෙර ගෙවුම් ගිණුමේ ශේෂය රු.833,778 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.911,912 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල තැන්පත් ගිණුම්වලට අදාලව ආරම්භක ශේෂය රු.3,393,738 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ විවිධ තැන්පත් ලෙජර ගිණුමේ ආරම්භක ශේෂය රු.236,040 ක් වැඩියෙන් පිටපත් කර තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේ ඉදිරියට ගෙනෙන ලද හිඟ හිටි වෙනත් ආදායම් ආරම්භක ශේෂය රු.4,902,264 ක් ලෙජරයේ ආදායම් ගිණුම්වලට අඩුවෙන් පිටපත් කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පුස්තකාල පොත් මිලදී ගැනීම් ලෙස රු.87,830 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පෙර ගෙවුම් ලෙස රු.82,878 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ විවිධ තැන්පත් ශේෂය ලෙස රු.41,817,475 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,367,241 ක් වන ස්ථාවර තැන්පතුව මූල්‍ය ප්‍රකාශනවලින් මඟ හැරී තිබුණි.

(ඔ) ඉතිරි කිරීමේ ගිණුම් 03කට අදාලව රු.102,918 ක පොලී ආදායම අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ සභාවේ සේවයේ නියුතු සේවකයින් 38 ක් වෙනුවෙන් තබා තිබූ ඇප තැන්පත් රු.502,272 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත වී නොතිබුණි.

(ක) ප්‍රවර්තන වර්ෂයේ ණය පොලී වටිනාකම රු.216,904 ක් පොලී වියදමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ග) දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු මුළු පොලී වටිනාකම වන රු.3,435,097 ක් සඳහා ණයහිමියන්ට වෙන්කිරීම් කර නොතිබුණි.

(ච) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමි ලෙස රු.705,243 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ජ) වීථි රේඛා සහතික නිකුත් කිරීමෙන් සභාව උපයා තිබූ රු.678,030 ආදායම ගිණුම්ගත නොවීමෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ට) පොදු උපයෝගී සේවා වැඩසටහන යටතේ ප්‍රාග්ධන ආදායම් රු.93,000 ක් අඩුවෙන් මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශයට පිටපත් කර තිබුණි.

(ඩ) සුභ සාධක සහ පොදු පහසුකම් යටතේ ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා වියදම ලෙස රු.900,000 ක් වැඩියෙන් මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශයට පිටපත් කර තිබුණි.

(ණ) පොදු උපයෝගී සේවා යටතේ සැපයුම් හා උපකරණ වියදම වූ රු.648,750 ක් මුළු මෙහෙයුම් වියදමෙන් මඟ හැරී තිබුණි.

(ත) විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික වියදම වූ රු.699,036 ක් මුළු මෙහෙයුම් වියදම අඩුවෙන් දක්වා තිබුණි.

(ද) හිඟ හිටි වරිපනම් බදු ආදායම රු.300,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(න) සමාලෝචිත වර්ෂයේ හඳුනා නොගත් ගිණුම් ශේෂය රු.3,479,655 ක් සමුච්චිත අරමුදලට ගැලපීමෙන් එම වටිනාකමින් වැඩියෙන් පෙන්නුම් කෙරිණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 84,715,760 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාල ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.3,683,649 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 90,768,360 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.75,689,780 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

රු.328,694,574 ක් වටිනා ගිණුම් විෂයයන් 07අවශ්‍යා තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා ක් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.43,001,739 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.35,355,602 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

---------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයන්ට අදාලව මහා නගර සභා අරමුදලට ලැබිය යුතු හිඟ හිටි ආදායම රු.55,747,980 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ආදායමෙන් 67% ක් (රු.44,085,716) ක් හිඟ හිටිව පැවතුණි.

(ආ) මහා නගර සභා ආඥා පනතේ XII වන කොටස 254(7) වගන්තියේ විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ එකතුව රු.77,425,832 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මහා නගර සභා ආඥා පනතේ XII වන කොටස 230 වගන්තියේ විධිවිධාන අනුව සභාව සතු වරිපනම් දේපල සම්බන්ධයෙන් වර්ෂ 5 කට වරක් දේපල තක්සේරු කළයුතු වුවත්, සභාව එසේ කටයුතු කර නොතිබුණි.

(ඈ) මහා නගර සභා ආඥා පනතේ 247 (අ) (ආ) (ඇ) වගන්තියේ විධිවිධාන අනුව මහා නගර සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන වෙළෙඳ ව්‍යාපාර 28 ක් වෙනුවෙන් වෙළෙඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඉ) මහා නගර සභා ආඥා පනතේ 237 වගන්තියේ විධිවිධාන අනුව වාර්ෂික වටිනාකමට බලපාන පරිදි 2014 වර්ෂයේ දී භෞතික වෙනස්කිරීම් සිදුකරන ලද දේපල 34 ක් සඳහා නව තක්සේරුවක් සිදු නොකර 2007 තක්සේරු වටිනාකම මත වරිපනම් බදු අයකර තිබුණි.

2.2.2 **බදු කුලී**

---------

2015 වර්ෂය වෙනුවෙන් අයවිය යුතු හිඟ ටෙන්ඩර් බදු කුලිය රු.4,588,015 ක් අයකර ගෙන නොතිබුණි.

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ වෙනුවෙන් රු.297,717 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.5,103,461 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1. **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

විගණන දිනය වූ 2016 ජනවාරි 27 දින වාහන හා උපකරණ භෞතික පරීක්ෂාවට ලක් කරනු ලැබූ අතර, වර්ග 17 කට අයත් වාහන හා උපකරණ පිළිබඳ තොරතුරු ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත්ව නොතිබුණි.

3.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

2015 වර්ෂයේ ගිවිසුම් අත්සන් කර තිබූ රු.7,982,439 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 16 ක් ඉටු කර නොතිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

-----------------------------------------

4.1 **අයවැය පාලනය**

-----------------

සමාලෝචිත වර්ෂයේ දී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

-----------------------

2015 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

----------------------------------------------------------

ප්‍රවර්තන වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

4.5 **වත්කම් කළමනාකරණය**

----------------------------

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

මහා නගර සභාවට අයත් වාහන 3 ක් නිෂ්කාර්යව පැවතුණි.

**4.6 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්**

---------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව විගණන විමසුමකට පිළිතුරු ලැබී නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) කොන්ත්‍රාත් පාලනය
(ඈ) ණයගැති සහ ණයහිමි පාලනය